**පුරප්පාඩු**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය**

SRI LANKA STANDARDS INSTITUTION
GUARDIAN OF QUALITY

## ප්‍රාථමික මට්ටම – අර්ධ පුහුණු කාණ්ඩය (PL - 2 ශ්‍රේණිය III)

**පුරප්පාඩු:**

**(1) පුස්තකාල සහායක / පොත් බදින්නා**
**(2) නඩත්තු සහායක**
**(3) සාම්පල් ගබඩා සහායක**
**(4) ක්‍රමාංකන සහායක**
**(5) රසායනාගාර සහායක**
**(6) රසායනික ද්‍රව්‍ය ගබඩා සහායක**
**(7) මුද්‍රණ සහායක**

---

❖ **ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ;**

බාහිර අයදුම්කරුවන්

එක් එක් තනතුරේ කාර්යභාරයට අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කර ඇති ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : (පහත 1 හෝ 2)

1. බාහිර අයදුම්කරුවන් සඳහා නියමිත ඉහත සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. නුපුහුණු සේවක ශ්‍රේණියේ සේවකයන් අතරින්, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු නිපුණතාවයක් ඇති බව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් මඟින් සනාථ කර තිබිය යුතුය.

❖ **තෝරාගැනීමේ ක්‍රමවේදය:**

වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

❖ **වැටුප් පරිමාණය :**

රු. 42 300.00 – 10 x 490.00 – 10 x 540.00 – 10 x 590.00 – 12 x 630.00 – රු. 66 060.00
(මෙය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව වාරික දෙකකින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2026 වර්ෂයේදී රු. 40 008.00 ක් සහ 2027 වර්ෂයේදී රු. 42 300.00 ක් වේ.)

❖ **අනෙකුත් :**
සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරි නිසි ලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.
iii. උසස් ආචාරශීලීත්වයකින් යුත් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

❖ **වයස් සීමාව :**

අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**අනෙකුත් ප්‍රතිලාභ :**

1. ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවනු ලැබේ.
2. ජීවිත රක්ෂණ ආවරණය සහ වෛද්‍ය රක්ෂණ ආවරණය හිමිවේ.
3. නියමිත සීමාවක් යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය.
4. මහා භාණ්ඩාගාරය මගින් අනුමත වාර්ෂික දිරි දීමනා ගෙවනු ලැබේ.
5. වෘත්තීයමය පරිසරයක සේවය කිරීමට අවස්ථාව හිමිවේ.

---

**අයදුම්පත් යොමු කිරීමේ උපදෙස් :**

1. නියමිත අයදුම්පත්‍රය බාගත කර (Download), නිවැරදිව තොරතුරු ඇතුලත් කර නිසි පරිදි සම්පූර්ණ කල යුතුය. අයදුම්පත්‍රය පහත දැක්වෙන සබැඳිය (Link) හෝ QR කේතය මගින් ලබා ගත හැක. (වෙනත් කිසිදු ආකෘතියකින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් සමග වෙනත් කිසිදු ලේඛනයක් අමුණා නොඑවිය යුතුය.)

2. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන සබැඳිය (Link) හෝ QR කේතය ඔස්සේ පිවිසිය හැකි Google Form එක නිවැරදිව සම්පූර්ණ කිරීම අනිවාර්ය වන අතර, එයට නිසි පරිදි සම්පූර්ණ කර, ස්කෑන් (Scanned) කරන ලද අයදුම්පත්‍රය ඇමිණිය යුතුය. එසේම ප්‍රකාශයට පත් කර ඇති තනතුරු එකකට වඩා වැඩි ගණනක් අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර වෙනුවෙන් වෙන වෙනම Google Form එකක් සහ ඊට අදාල වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. අයදුම් කරන එක් එක් තනතුර සඳහා වෙන වෙනම සම්පූර්ණ කරන ලද මුල් අයදුම්පත (Original Application) වෙන වෙනම ලියුම් කවර වල බහා ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතුය.

   රාජ්‍ය අංශයේ ආයතන වල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මගින් යොමු කල යුතුය.

3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද මුල් අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීමේදී ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර, **2026 ජුනි මස 08** වන දින හෝ එදිනට පෙර එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

   **අයදුම්පත් යොමු කල යුතු ලිපිනය:**

   අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>අංක 17, වික්ටෝරියා පෙදෙස<br>ඇල්විටිගල මාවත<br>කොළඹ 08

---

- **ප්‍රාථමික මට්ටමේ – අර්ධ පුහුණු කාණ්ඩයේ (PL - 2 ශ්‍රේණිය III) තනතුරු සඳහා සබැඳිය**
  https://slsi.lk/en/careers/

- **QR Code:**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**Tel: 011-2671567-72**
**011-2019600**